## බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2017 අගෝස්තු මස 08 වන දින පෙ.ව. 9.30 ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

1. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.07.18 දින අසන ලද ප්‍රශ්නය, (ප්‍ර /vi(1)/17/65)

(අ) ප්‍රවාහන අධිකාරියේ හෝමාගම ප්‍රාදේශීය කාර්යාලයේ තනතුරු කීයක් පුරප්පාඩු වී ඇත්තේද?

(ආ) ඒ කවදා සිටද?

(ඇ) ඒ සඳහා වැඩ බැලීමට පත් කරන ලද පුද්ගලයන්ගේ නම් සහ තනතුරු මොනවාද?

(ඈ) එම වැඩ බැලීම වෙනුවෙන් එක් එක් පුද්ගලයා වෙත අතිරේකව ගෙවනු ලබන දීමනා වෙන් වෙන්ව සඳහන් කරන්නේද?

(ඉ) මෙම පුරප්පාඩු පිරවීමකින් තොරව පුද්ගලයන් වැඩ බැලීමට යොදවා අතිරේක දීමනා ගෙවන්නේ පෞද්ගලික හිතවත්කම් මතද?

(ඊ) මෙම වැඩ බැලීම සිදු කිරීම නවත්වා එකී තනතුරු වලට ආයතනය තුළ සිටින සුදුස්සන් හෝ පිටතින් පුද්ගලයින් බඳවා නොගන්නේ මන්ද?

(උ) තනතුරු දෙකක වැඩ කිරීමේ දී කාර්යයගුරුව එකී කාර්යයන් ඉටු කිරීම අපහසු වන බවත්, එමඟින් මහජනයාට විධිමත් සේවාවන් සැපයීමක් කළ නොහැකි බවත් ඔබතුමා පිළිගන්නේද?

(ඌ) පාඩු ලබමින් සහ රජයෙන් දීමනා ලබමින් ධාවනය වන ශ්‍රී ලංගම සේවාවන්ට වඩා වැඩි බස් රථ ප්‍රමාණයක් තමන්ගේම වියදමින් සියලු කටයුතු සිදු කර ගෙන රජයටද ආදායමක් ලබා දී ධාවනයේ යෙදෙන පෞද්ගලික බස්රථ ධාවකයන්ට වඩා යහපත් සේවාවක් ලබා දීමට හැකි වන ලෙස ඔබ අමාත්‍යාංශයේ පවතින දුර්වලතා / අඩුපාඩු නිවැරදි කිරීමට ඔබතුමා පියවර ගන්නේද?

(එ) නොඑසේ නම් ඒ මන්ද?

2. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.07.18 දින අසන ලද ප්‍රශ්නය, (ප්‍ර /vi(1)/17/66 )

(අ) ප්‍රවාහන අධිකාරියේ රත්මලාන ප්‍රාදේශීය කාර්යාලයේ තනතුරු කීයක් පුරප්පාඩු වී ඇත්තේද?

(ආ) ඒ කවදා සිටද?

(ඇ) ඒ සඳහා වැඩ බැලීමට පත් කරන ලද පුද්ගලයන්ගේ නම් සහ තනතුරු මොනවාද?

(ඈ) එම වැඩ බැලීම වෙනුවෙන් එක් එක් පුද්ගලයා වෙත අතිරේකව ගෙවනු ලබන දීමනා වෙන් වෙන්ව සඳහන් කරන්නේද?

(ඉ) මෙම පුරප්පාඩු පිරවීමකින් තොරව පුද්ගලයන් වැඩ බැලීමට යොදවා අතිරේක දීමනා ගෙවන්නේ පෞද්ගලික හිතවත්කම් මතද?

(ඊ) මෙම වැඩ බැලීම සිදු කිරීම නවත්වා එකී තනතුරු වලට ආයතනය තුළ සිටින සුදුස්සන් හෝ පිටතින් පුද්ගලයින් බඳවා නොගන්නේ මන්ද?

(උ) තනතුරු දෙකක වැඩ කිරීමේ දී කාර්යයගුරුව එකී කාර්යයන් ඉටු කිරීම අපහසු වන බවත්, එමඟින් මහජනයාට විධිමත් සේවාවන් සැපයීමක් කළ නොහැකි බවත් ඔබතුමා පිළිගන්නේද?

(ඌ) පාඩු ලබමින් සහ රජයෙන් දීමනා ලබමින් ධාවනය වන ශ්‍රී ලංගම සේවාවන්ට වඩා වැඩි බස් රථ ප්‍රමාණයක් තමන්ගේම වියදමින් සියලු කටයුතු සිදු කර ගෙන රජයටද ආදායමක් ලබා දී ධාවනයේ යෙදෙන පෞද්ගලික බස්රථ ධාවකයන්ට වඩා යහපත් සේවාවක් ලබා දීමට හැකි වන ලෙස ඔබ අමාත්‍යාංශයේ පවතින දුර්වලතා / අඩුපාඩු නිවැරදි කිරීමට ඔබතුමා පියවර ගන්නේද?

(එ) නොඑසේ නම් ඒ මන්ද?

3. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.07.18 දින අසන ලද ප්‍රශ්නය, (ප්‍ර/vi(1)/ 17/67 )

(අ) ප්‍රවාහන අධිකාරියේ කළුතර ප්‍රාදේශීය කාර්යාලයේ තනතුරු කීයක් පුරප්පාඩු වී ඇත්තේද?

(ආ) ඒ කවදා සිටද?

(ඇ) ඒ සඳහා වැඩ බැලීමට පත් කරන ලද පුද්ගලයන්ගේ නම් සහ තනතුරු මොනවාද?

(ඈ) එම වැඩ බැලීම වෙනුවෙන් එක් එක් පුද්ගලයා වෙත අතිරේකව ගෙවනු ලබන දීමනා වෙන් වෙන්ව සඳහන් කරන්නේද?

(ඉ) මෙම පුරප්පාඩු පිරවීමකින් තොරව පුද්ගලයන් වැඩ බැලීමට යොදවා අතිරේ
ගෙවන්නේ පෞද්ගලික හිතවත්කම් මතද?

(ඊ) මෙම වැඩ බැලීම සිදු කිරීම නවත්වා එකී තනතුරු වලට ආයතනය තු
සුදුස්සන් හෝ පිටතින් පුද්ගලයින් බඳවා නොගන්නේ මන්ද?

(උ) තනතුරු දෙකක වැඩ කිරීමේ දී කාර්යයගුරව එකී කාර්යයන් ඉටු කිරීම අප
බවත්, එමඟින් මහජනයාට විධිමත් සේවාවන් සැපයීමක් කළ නොහැකි බවත්
පිළිගන්නේද?

(ඌ) පාඩු ලබමින් සහ රජයෙන් දීමනා ලබමින් ධාවනය වන ශ්‍රී ලංගම සේවාව
වැඩි බස් රථ ප්‍රමාණයක් තමන්ගේම වියදමින් සියලු කටයුතු සිදු කර ගෙන
ආදායමක් ලබා දී ධාවනයේ යෙදෙන පෞද්ගලික බස්රථ ධාවකයන්ට වඩා
සේවාවක් ලබා දීමට හැකි වන ලෙස ඔබ අමාත්‍යාංශයේ පවතින දුර්වලතා /
නිවැරදි කිරීමට ඔබතුමා පියවර ගන්නේද?

(එ) නොඑසේ නම් ඒ මන්ද?

4. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මු
ක්‍රමසම්පාදන, ඉංජිනේරු, සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා
පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලස
හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.07.18 දින
ලද ප්‍රශ්නය,

(ප්‍ර /vi(1)/

(අ) 2015 සිට 2017 ජුනි 06 දක්වා කඩුවෙල මහ නගර සභාව විසින් කරන ල
සංවර්ධන ව්‍යාපෘති ගණන කීයද?

(ආ) එම සියලු මාර්ග සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධව,

i. ව්‍යාපෘතියේ නම
ii. ප්‍රතිපාදන මූලාශ්‍රය
iii. ඇස්තමේන්තු මුදල
iv. ව්‍යාපෘතිය ප්‍රදානය කලේ ටෙන්ඩර් මගින් ද වෙනත් ක්‍රමයක් මගින්ද යන ව
v. අවසාන වශයෙන් කොන්ත්‍රාත්තුව තීරණය වූ මුදල .
vi. ව්‍යාපෘතිය කළ අයගේ නම හා ලිපිනය
vii. වැඩ පටන්ගත් දිනය
viii. වැඩ අවසන් කළ දිනය
ix. ගෙවීම් අවසන් කර ඇති නම් එම දිනය

යන තොරතුරු ඇතුලත් වාර්තාවක් ඉදිරිපත් කරන්නේද?

(ඇ) මහජන නියෝජිත පාලනයක් නැති තත්ත්වයක් තුල මහ නගර සභාවේ ප්‍ර
යොදවා කරන ව්‍යාපෘති කවරේද?යන්න තීරණය කරන්නේ කවුරුන්ද?

(ඈ) සංවර්ධනය නොකල එහෙත් සංවර්ධනය කළ යුතු මාර්ග ඇති බව ඔබතුමා දන්

(ඉ) ප්‍රමුඛතාවය අනුව හඳුනාගත් මාර්ග සංවර්ධනයට වැඩ පිළිවෙලක් තිබේද?

(ඊ) ඉදිරියේ සංවර්ධනය කළ යුතු මාර්ග පිළිබඳ ප්‍රමුඛතාවය අනුව නම් කළ හැකිද?

(උ) ඒ අනුව මාර්ග පිළිබඳව ලේඛනයක් ඉදිරිපත් කරන්නේද?

(ඌ) නොඑසේ නම් ඒ මන්ද?

5. ගරු උද්දේන විජේරත්න මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.07.18 දින අසන ලද ප්‍රශ්නය, (ප්‍ර/vi(1)/ 17/70 )

(අ) 2015 සිට 2017 ජූනි 30 දක්වා මීරිගම ප්‍රාදේශීය සභාව විසින් කරන ලද මාර්ග සංවර්ධන ව්‍යාපෘති ගණන කීයද?

(ආ) එම සියලු මාර්ග සංවර්ධන ව්‍යාපෘති (ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන, විමධ්‍යගත, පළාත් සභා, ප්‍රාදේශීය සභා සහ අනෙකුත්)

i. ව්‍යාපෘතියේ නම
ii. ප්‍රතිපාදන මූලාශ්‍රය
iii. ඇස්තමේන්තු මුදල
iv. ව්‍යාපෘතිය ප්‍රදානය කලේ ටෙන්ඩර් මඟින් ද වෙනත් ක්‍රමයක් මඟින්ද යන වග
v. අවසාන වශයෙන් කොන්ත්‍රාත්තුව තිරණය වූ මුදල
vi. ව්‍යාපෘතිය කළ අයගේ නම හා ලිපිනය
vii. වැඩ පටන්ගත් දිනය
viii. වැඩ අවසන් කළ දිනය
ix. ගෙවීම් අවසන් කර ඇති නම් එම දිනය
x. ගෙවීම් නොකර ඇති ව්‍යාපෘති ගණන
xi. 2017/06/30 වනවිට අතරුදවුම් ගණන
xii. 2016 වර්ෂයේ වැඩවල නොගෙවා ඇති ව්‍යාපෘති
xiii. එසේ නොගෙවීමට හේතු

යන තොරතුරු ඇතුලත් වාර්තාවක් ඉදිරිපත් කරන්නේද?

6. ගරු උදේන විජේරත්න මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.07.18 දින අසන ලද ප්‍රශ්නය,

(ප්‍ර/vi(1)/ 17/71 )

(අ) මීරිගම නාගරික සීමාව තුළ අනවසර ගොඩනැගිලි ඉදිකර තිබේද?

(ආ) එසේනම් ඒවායේ ලේඛනයක් විස්තර සහිතව ඉදිරිපත් කරන්නේද?

(ඇ) අනුමැතියකින් තොරව ඉදිකිරීම් සිදුකර ඇත්නම් ඒ සම්බන්ධයෙන් මීරිගම ප්‍රාදේශීය සභාව දැනට ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද?

(ඈ) එක් එක් අනවසර ඉදිකිරීම්වලට ගත් නීතිමය පියවර වෙන වෙනම ඉදිරිපත් කළ හැකිද?

(ඉ) මෙම ඉදිකිරීම්වලින් මුදල් අයකර ගන්නවාද?

(ඊ) මෙම ඉදිකිරීම්වලට විදුලිය දී ඇත්තේ කාගේ අනුමැතියෙන්ද?

(උ) මේ සඳහා වගකිව යුතු පුද්ගලයින් හෝ නිලධාරීන් කවුරුන්ද?

(ඌ) ඔවුන්ට විරුද්ධව ගත් ක්‍රියාමාර්ග මොනවාද?

(එ) අදාළ බල ප්‍රදේශයේ ඉදිකර ඇති අනවසර ගොඩනැගිලි ඉවත්කිරීමට බලයක් මීරිගම ප්‍රාදේශීය සභාවට නොමැතිද?

(ඒ) එසේ ඉවත්කිරීමට බලයක් මීරිගම ප්‍රාදේශීය සභාවට ඇත්නම් මීරිගම නාගරික සීමාවතුළ ඉදිකර ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කරන්නේ කුමන දිනට ප්‍රථමයෙන්ද?

(ඔ) ප්‍රාදේශීය සභා පනතට අනුකූලව අනවසර ඉදිකිරීම් ඉවත්කිරීමට බලයක් තිබුන ද මෙම අනවසර ඉදිකිරීම් ඉවත් නොකිරීම, සම්බන්ධයෙන් අදාළ නිළධාරීන්ට නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ඔබතුමා ගන්නේද?

7. ගරු උදේන විජේරත්න මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.07.18 දින අසන ලද ප්‍රශ්නය, (ප්‍ර/vi(1)/ 17/72 )

(අ) විවිධ සේවා සමූපකාර සමිතියක ඡන්දයෙන් පත්වන අධ්‍යක්ෂ මණ්ඩලයකට බලයේ සිටිය හැක්කේ කොපමණ කාලයකටද?

(ආ) මීරිගම විවිධ සේවා සමූපාකාර සමිතියේ වසර අටක් එකම අධ්‍යක්ෂ මණ්ඩලයක් වරින වර බලයේ සිටි බව ඔබතුමා දන්නේද?

(ඇ) මෙම සමූපාකාර සමිතියේ 2014 වර්ෂයේ මාස කිහිපයක කොමසාරිස් පාලනය,

සභාපතිධුරයේ සිටියදී ග්‍රාමීය බැංකුවෙහි ණය නොගෙවා කල්පසු ණයකරුවෙකු 2011 සභාපතිධුරයෙන් ඉවත්කළ අලස් මහතාට, භාරදුන්නේ කුමන නෛතික පදනමකින්ද?

(ඈ) එසේ පත්වූ සභාපතිතුමාගේ මැදිහත්වීමෙන් 2014-2017 කාලයේ සමිතියට වූ පාඩුවට වගකිව යුත්තෝ හා ඒ පිළිබඳ ගෙන තිබෙන නීතිමය පියවර මොනවාද?

(ඉ) 2014 පසු,

i. සභාපතිතුමාගේ නියමයෙන් ඔහුගේ හිතවතුන්ට සමූපකාර ඉන්ධන පිරවුම්හලෙහි මුදල්වලින් ලක්ෂ තිහකට ආසන්න මුදලක් දී සමිතියට පාඩු කිරීම.

ii. ග්‍රාමීය බැංකුවේ කෝටි විස්සක් වෙළඳ ගිවිසුමට පටහැනිව ලීසිං කොම්පැනියක මුදල් තැන්පත් කිරීම.

iii. සමූපකාරය නමින් තිබූ කොකා කෝලා හා වටවල තේ ඒජන්සි සමිතියෙන් ඉවත් කර ඔහුගේ පෞද්ගලික නමට පවරා ගැනීම.

වැනි අයථා වැඩවලට ගන්නා ක්‍රියාමාර්ග කවරේද?

(ඊ) දැන් පවතින කොමසාරිස් පාලනය නැවත වෙනත් පුද්ගලයන්ට පවරනවාද?

(උ) නඩු කටයුතු අවසන් වී ඇතිනම් නැවත නිලවරණයක් පවත්වන්නේ කවදාද?

8. ගරු රජිත රංගන හපුආරච්චිගේ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.07.18 දින අසන ලද ප්‍රශ්නය,

(ප්‍ර/vs(1)/ 17/73 )

(අ) 2007 වර්ෂයේ සිට කටාන ප්‍රාදේශීය සභා සීමාව තුල සිදු කර ඇති ඉඩම් කට්ටි කිරීම් සංඛ්‍යාව කොපමණද?

(ආ) එලෙස කට්ටි කොට විකුණන ලද ඉඩම් වල ලැයිස්තුවක් ඔබතුමා විසින් සභාගත කරන්නේද?

(ඇ) (i) එම ඉඩම් වලින් පොදු භූමි වෙන් කිරීමට නිර්දේශ කොට ඇති ඉඩම් සංඛ්‍යාව කොපමණද?

(ii) ඒ මොනවාද?

(ඈ) (i) එම ඉඩම් වලින් පොදු ඉඩම් වලින් සභාවට නීත්‍යානුකූලව පවරා ගනු ලැබූ වෙන්දේසි ඉඩම් කීයක් තිබේද?

(ii) ඒ මොනවාද?

(iii) පොදු භූමි පවරා නොගත් වෙන්දේසි ඉඩම් වල ලැයිස්තුවක් ඉදිරිපත් කළ හැකිද?

(ඉ) කටාන ප්‍රාදේශීය සභා සීමාව තුල වෙන්දේසි කර විකුණුලැබූ ඉඩම් වල විකුණුම් වටිනාකමින් 1% බදු මුදල සම්පූර්ණයෙන් අය කර ගත් ඉඩම් සංඛ්‍යාව කොපමණද?

(ඊ) (i) එලෙස සභාවට අයවිය යුතු මුළු බදු වටිනාකම කොපමණද?

(ii) එම වටිනාකමින් මේ දක්වා අය කොට ගෙන ඇති බදු වටිනාකම කොපමණද?

(iii) එම පොදු ඉඩම් පවරා ගැනීමටත් බදු මුදල් අය කර ගැනීමටත් ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

(උ) එලෙස සභාවට අය විය යුතු බදු මුදල් අය කර ගැනීමට කටයුතු නොකළ පාර්ශවයන් විරුද්ධව ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

9. ගරු එස්.ඒ.ඩී. ජගත් කුමාර මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.07.18 දින අසන ලද ප්‍රශ්නය, (ප්‍ර/vi(1)/ 17/74 )

අ. බත්තරමුල්ල හා කඩුවෙල විවිධසේවා සමූපකාර සමිති ඉතාම අපහසුතාවෙන් පා ලබමින් පවත්වාගෙන යන බව ඔබතුමා දන්නේද?

ආ. මෙම සමූපකාර සමිති දෙකේ පසුගිය 2012 වසරේ සිට වසර 4කට අදාලව වත්කම් ෘ බැරකම් පිළිබඳ තොරතුරු වර්ෂයෙන් වර්ෂය වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද?

ඇ. මෙම සමූපකාර සමිතිය පසුගිය වර්ෂ 4 තුල දිගින් දිගටම අලාභ ලබමින් පවත්වාගෙ යාමට හේතුව ඔබතුමා දන්නේද? දන්නේනම් පාඩු ලැබීමට හේතු මොනවාද?

ඈ. මෙම සමූපකාර සමිති දෙකෙහි සේවක සංඛ්‍යාව වෙන් වෙන්ව සඳහන් කරන්නේද කඩුවෙල හා බත්තරමුල්ල සමිති දෙකේ ප්‍රාදේශික වෙළඳසැල් කොපමණද? එම ප්‍රාදේශී වෙළඳසැල් වලින් කොපමණ ප්‍රමාණයක් බාහිර පුද්ගලයින්ට කුලියට හෝ බදු පදනමි ලබාදී තිබේද? එසේ දී තිබේනම් ඒවා වෙන් වෙන්ව සඳහන් කරන්නේද?

10. ගරු එස්.ඒ.ඩී. ජගත් කුමාර මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.07.18 දින අසන ලද ප්‍රශ්නය, (ප්‍ර/vi(1)/ 17/75 )

අ. බත්තරමුල්ල හා කඩුවෙල විවිධ සේවා සමූපාකාර සමිති දෙකේ සේවක පඩිනඩි ගෙවීම ප්‍රමාණවත් ආදායමක් පවතින්නේද? එසේ නැතිනම් එයට හේතු මොනවාද?

ආ. මෙම සමිතිවල පාරිභෝගික අංශයේ පමණක් වත්කම් බැරකම් කොපමණද? යන් ඔබතුමා දන්නේද? ඒවා වෙන් වෙන්ව සඳහන් කරන්නේද?

ඇ. බත්තරමුල්ල හා කඩුවෙල සමිති දෙකේ ග්‍රාමීය බැංකු අංශයෙන් පසුගිය වසර 4 ක කාල තුල එක් එක් සමිතිය ණය ලබාගෙන තිබෙන ආකාරය ඔබතුමා දන්නේද? එය වෙ වෙන්ව සඳහන් කරන්නේද?

ඈ. එම ණය පියවීම සඳහා මෙම සමූපකාර සමිති දෙකේ අධ්‍යක්ෂ මණ්ඩල මේ වන විට ගෙ ඇති ක්‍රියා මාර්ග කවරේද?

ඉ. බත්තරමුල්ල විවිධසේවා සමුපකාර සමිතියේ අවසන් වරට ඡන්දයෙන් පත්ව සිටි සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය සිදුකර ඇති විෂමාචාරයන් හා සමිතිය වෙත සිදු කරඇති පාඩු ඔබතුමා දන්නේද?

එම තත්ත්වයන් වෙන වෙනම පැහැදිලි කරන්නේද?

ඊ. එම අය පිළිබඳව ඔබතුමා ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද?

උ. කඩුවෙල හා බත්තරමුල්ල විවිධසේවා සමුපකාර සමිති දෙකේ වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය පත්කර තිබෙන්නේ කුමන පදනමකින්ද?

ඌ. මෙම සමිති දෙකේ නිල කාලයන් අවසන්ව ඇති බැවින් ඡන්ද පැවැත්වීමට කටයුතු සිදු කරන්නේද?

එ. එය කුමන කාලයේ සිදු කරන්නේද?

11. ගරු එස්.ඒ.ඩී. ජගත් කුමාර මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම <u>සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.07.18 දින අසන ලද ප්‍රශ්නය, (ප්‍ර/vi(1)/ 17/76)</u>

අ. බත්තරමුල්ල හා කඩුවෙල විවිධසේවා සමුපකාර සමිති දෙකේ නොබෝදා පත් කරන ලද (දින කිහිපයකට පෙර පත් කල) සභාපති පත් කලේ කුමන පදනමකින්ද?

ආ. ඔහු විදේශ සංචාර සඳහා පිටත්ව තිබේද? ඒ සඳහා කොපමණ වියදමක් දරා තිබේද? එම වියදම් දරා ඇත්තේ කුමන අංශ වලින්ද?

ඇ. බත්තරමුල්ල හා කඩුවෙල සමිති වල පසුගිය වසර 05 ක කාලය තුල හිටපු අධ්‍යක්ෂ මණ්ඩල විදේශ සංචාර කොතරම් ප්‍රමාණයක් සිදුකර තිබේද?

ඈ. ඒ සඳහා කෙතරම් වියදමක් දරා තිබේද? යන්න අදාල සංචාරය හා වියදමත් සංචාරයට සහභාගි වූ අධ්‍යක්ෂවරයාත් ආදී නිවැරදි තොරතුරු මෙම ගරු සභාවට වෙන් වෙන්ව ඉදිරිපත් කරන්නේද?

ඉ. බත්තරමුල්ල කඩුවෙල සමිති දෙක මෙවැනි දැවැන්ත කඩා වැටීමටකට ලක්ව ඇත්තේ අවසන් වරට ඡන්දයෙන් පත්වූ අධ්‍යක්ෂ මණ්ඩල විසින් ගනු ලැබූ තීරණ හේතුවෙන් ඔබ ඔබතුමා පිළිගන්නේද?

ඊ. නොඑසේ නම් ඒ මන්ද?

## • කාර්ය පටිපාටි රීති අංක 31 (අ) 1 හි විධිවිධාන අනුව පිළිතුරු දීමට කල්ගන්නා ලද ප්‍රශ්න.

12. • ගරු සුසිල් කිඳෙල්පිටිය මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධ පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.07.18 දින සභාව කල්තබන අවස්ථාවේදී අසන ලද ප්‍රශ්නය,

(ප්‍ර/vi(1)/ 17/ADG - 03

(අ) ගම්පහ බැංකු සංගමයෙන් වෙන්දේසි කිරීම සඳහා ඉඩමක් මිලදී ගත්තේද?

(ආ) එසේ ගත්තේ නම් ප්‍රදේශය හා ස්ථානයේ ලිපිනය කුමක්ද?

(ඇ) ඉඩමේ ප්‍රමාණය කොපමණද?

(ඈ) මෙම ඉඩමට කොපමණ මුදලක් ගෙව්වේද?

(ඉ) එම මුදල සපයා ගත්තේ කෙසේද?

(ඊ) බැංකු සංගමය මේ සඳහා වැය කල මුදල කොපමණද?

(උ) මේ සඳහා බැංකු ණයක් ලබා ගත්තේද?

(ඌ) ඒ පිළිබඳව පැහැදිලි කරන්නේද? නොඑසේ නම් මන්ද?

13. • ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළා පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාද හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.07.18 දින සභ කල්තබන අවස්ථාවේදී අසන ලද ප්‍රශ්නය,

(ප්‍ර/vi(1)/ 17/ADG - 04

(අ) වැවල කරදියාන කසළ අංගන භූමි කොටසක විදුලි උත්පාදන යන්ත්‍රයක් මගින කැළි කසල දහනය සඳහා ව්‍යාපෘතියක් වෙනුවෙන් ගිවිසුම් අත්සන් කරනු ලැබුවේද?

(ආ) අත්සන් කරන ලද එකී ගිවිසුම් පිටපත් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

(ඇ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දුන් පාරිසරික ඇගයීම් වාර්තාවක් ලබා ගෙන තිබේද?

(ඈ) පාරිසරික ඇගැයීම් වාර්තාව මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

(ඉ) දැනට ලෝකයේ තිබෙන තාක්ෂණය අතින් ඉහළ තත්ත්වයේ ඇති පරිස හානිය අවම කර ගත් දකුණු කොරියානු යන්ත්‍රය ලබා නොගැනීමට හේ කවරේද?

(ඊ) කරදියාන කසළ අංගනයේ කෙරෙන ව්‍යාපෘතිය හා බස්නාහිර සංවර්ධන අමාත්‍යවරයාගේ කාර්යභාරය අතර ඇති සම්බන්ධය කුමක්ද?

14. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින්ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.07.18 දින සභාව කල්තබන අවස්ථාවේදී අසන ලද ප්‍රශ්නය, (ප්‍ර/vi(1)/ 17/ADG - 05 )

(අ) කරදියාන කසළ අංගනයට කසළ දැමීම සඳහා අවසර ඉල්ලා කොළඹ මහ නගර සභාව හෝ කිසියම් පාර්ශවයක් අභියාචනාධිකරණයට හෝ ඉහළ අධිකරණයකට නඩුවක් ගොනු කර ඇති බව දැනගන්නට තිබේද?

(ආ) එවැනි නඩුවකට අදාල නොතිසි නිකුත් කිරීමක් ඔබතුමාට හෝ ඔබතුමාගේ බලාධිකාරියට අයත් ආයතනයකට ලැබී තිබේද?

(ඇ) ඒ කුමන දිනයක කුමන අධිකරණයකටද?

(ඈ) යෝජිත විදුලි ජනන ව්‍යාපෘතියකට බාධාවක් වන දැනට කසළ දමන ආයතනවලට පරිබාහිරව කරදියානේ කසළ ගොඩ ගැසීම නොකළ යුතු බව ඔබතුමා පිළිගන්නේද?

(ඉ) අධිකරණ කටයුත්තකදී ඒ බව සනාථ කිරීමට ගන්නා පියවර කවරේද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

15. ගරු එච්.එම්. උපාලි කොඩිකාර මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ප්‍ර/vi(1)/ 17/77 )

(අ) මාලපල්ල විජයඝෝෂ විද්‍යාලයේ 2017 වර්ෂයේ 1 වන ශ්‍රේණියේ පන්ති කීයක් තිබේද? (චක්‍ර ලේඛණයට අනුව)

(ආ) එම පන්තිවලට ඇතුලත් කරන ළමයි ගණන කීයද?

(ඇ) එම සම්මුඛ පරීක්ෂණයෙන් අදාල සීමාව තුල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් කී දෙනෙක් තෝරා ගෙන ඇත්ද?

(ඈ) ආදි ශිෂ්‍යයන්ගෙන් කී දෙනෙකු තෝරාගෙන ඇත්ද?

(ඉ) සහෝදර පදනමෙන් කී දෙනෙකු තෝරා ගෙන ඇත්ද?

(ඊ) රාජ්‍ය සේවකයන්ගෙන් කී දෙනෙකු තෝරාගෙන ඇත්ද?

(උ) වෙනත් ආකාරයෙන් දරුවන් ඇතුලත් කර ඇත්ද?

VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

IX. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

1. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය:

'දැඩි නියඟය අවසන්ව වැසි සමය ඉදිරියට එළඹෙනු ඇත. එහිදී දැඩි වර්ෂාවෙන් ඇති විය හැකි ගංවතුර තත්වයන් පාලනය කිරීමට පෙර සූදානමක් ඇතිව කටයුතු කලහොත් මහජනයාට විය හැකි ආපදා අවම කරගත හැකිවා මෙන්ම රජයට වන වියදම් රාශියක් ද අඩු කර ගත හැකිවනු ඇත. එබැවින් මේ වන විට පහසුවෙන් පිරිසිදු කළ හැකි ඇල මාර්ග සියල්ල පළාත් පාලන ආයතන මඟින් පිරිසිදු කරවා අනවසර ඉදිකිරීම් ඇත්නම් ඉවත් කරවා එකී ඇල මාර්ග රක්ෂිතයන් සලකුණු කර මහජන පීඩාවන් අවම කර ගැනීමට දීර්ඝ කාලීන වැඩපිළිවෙලක් දියත් කිරීමට කඩිනමින් ක්‍රියාකළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි.'

(යෝ/vi(1)/17/01)

2. ගරු අශෝක දයාරත්න මන්ත්‍රීතුමා:

'බස්නාහිර පළාත තුල කොළඹ, ගම්පහ සහ කළුතර යන දිස්ත්‍රික්කයන්හි පිහිටි බෞද්ධ විහාරස්ථාන සංඛ්‍යාව දෙදහසකට අධික වන අතර, මෙම සෑම විහාරස්ථානයකම ඉරුදින පෙරවරු දහම් පාසල් පවත්වා ගෙන යනු ලබයි. එහෙත් සති අග ඉරු දින හා පෝය නිවාඩු දිනවල පෞද්ගලික පන්ති පැවැත්වීමෙන් දරුවන් විශාල සංඛ්‍යාවක් පෞද්ගලික පන්ති කරා යොමුවන බැවින් දහම් පාසැල් නොපැමිණෙන බව දිස්ත්‍රික් ලේඛකාධිකාරි ස්වාමීන් වහන්සේලා පවසති. දැනටමත් සබරගමුව සහ මධ්‍යම පළාත් තුල ඉරු දින පස්වරු 1.00 දක්වා පෞද්ගලික පන්ති පැවැත්වීම එම පළාත් සභාවන් විසින් අත්හිටුවා ඇත.
මෙම තත්ත්වය තුල බස්නාහිර පළාත තුළ ඉරු දින හා පෝය නිවාඩු දිනවල පස්වරු 1.00 දක්වා පෞද්ගලික පන්ති පැවත්වීම වැළැක්වීම සඳහා නීති සකස් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි.'

(යෝ/vi(1)/17/02)

X. සභාව කල් තැබීම

එස්.එච්.ඩී. කේ. සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2017.07.19 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල, B පර්යන්තය,
සෙත්සිරිපාය.
බත්තරමුල්ල.